C
376
DOD

# නිදහසින් පසු ශ්‍රී ලංකා කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය (1948-1988)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධියේ අවශ්‍යතා
අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කරණ පර්යේෂණාත්මක නිබන්ධයයි.

නිබන්ධක - විමලා දොඩන්වල, ශාස්ත්‍රවේදී උපාධි (ලංකා) 1978
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා 1984

නිබන්ධක උපදේශක - අංශාධිපති ආර්.පි.ලියනගේ මහතා

පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.

1991

438224

## සාර සංග්‍රහය

ජීවමය වශයෙන් ගත්කල ගැහැණියත් පිරිමියාත් මිනිස් පැවැත්ම සඳහා වූ සම්පිණ්ඩනයකි. ජීවපූර්ණත්වය සඳහා ඒ දෙදෙනාම සමාන වන අතර, එකිනෙකා අභිභවා නැගී නොයන ආකාරයේ සම මානුෂික අයිතීන්ද හිමිකර ගනිති. ඒ මානුෂික අයිතිය අවශ්‍යතා අනුව නිදහස් ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව හා අවස්ථාව කාන්තාවටද හිමි විය යුතු බව අවධාරණය කරමින්, ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේද කාන්තාව පිළිබඳ පසුගිය දශකයේ සිට බලවත් උනන්දුවක් දක්වන සංවිධාන ඇතිවිය. කාන්තාවන් ගැන වැඩි උනන්දුවක් ඇති මෙවන් අවධියක 'නිදහසින් පසු ශ්‍රී ලංකා කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය' (Development of Women's Education In Sri Lanka Since Independence 1948 - 1988 ) යන මාතෘකාවක් යටතේ ශාස්ත්‍රීය පර්යේෂණයක් කර එය පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීම යෝග්‍ය යැයි මම සිතුවෙමි.

මෙම පර්යේෂණය සඳහා මා තෝරාගත්තේ ඓතිහාසික හා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයයි. මෙහිදී අධ්‍යයන ක්ෂේත්‍රය සංකීර්ණ වන නිසාත්, කාන්තාව ලැබූ පශ්චාත් අධ්‍යාපනය පිළිබඳ සමාන්තර පර්යේෂණයක් වෙනත් අයෙකු කරන නිසාත්, මගේ අධ්‍යයනයේ විෂයය සීමාව මූලික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපන අවධිය දක්වා පමණක් සීමා කරගතිමි. මෙම අධ්‍යයනය සඳහා දත්ත සපයා ගැනීමේදී බාධාවක් වූයේ බොහෝ සංඛ්‍යා දත්ත පොදු ජනගහනයේ ගැහැණු, පිරිමි වශයෙන් වෙන්කර දක්වූ දත්ත නොතිබීමයි. ඒ නිසා එවන් තත්හිදී කාන්තාව සඳහා පමණක් දත්ත වෙන්කර ගැනීම අපහසු විය. ජන සංගණනය දස අවුරුද්දකට වරක් පවත්වන්නක් නිසා කාන්තාවන් පිළිබඳ යම් යම් තොරතුරු රැස්කිරීමේදී සංගණන දෙකක් අතර

UNIVERSITY OF PERADENIYA
-3-9-1992
LIBRARY

කාලයේදී දත්ත ජන විකාශ විචල්‍ය අනුව වර්ගීකරණය කොට නොමැතිවීම බාධාවකි. තවද අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතා පුළුල් නිසා විධිමත් අධ්‍යාපනය පමණක් මගේ පර්යේෂණය සඳහා යොදා ගතිමි. පාසැල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය, ගුරු අධ්‍යාපනය හා කාර්මික අධ්‍යාපනය ගැන පමණක් මගේ අධ්‍යයනය සීමාකොට ගතිමි.

මෙවැනි අධ්‍යයනයකදී පළමුව සංකල්පය පැහැදිළි කිරීම වැදගත් වන හෙයින් එය මුලින් ඉදිරිපත් කිරීමට අදහස් කෙළෙමි. ප්‍රස්තුතයේ සඳහන් යෙරෙන පරිදි කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය තක්සේරු කිරීම සඳහා ප්‍රවේශයක් වශයෙන් කාන්තාව අධ්‍යාපනය ලැබීමේ වැදගත්කම විමර්ශනය කිරීමට පළමු පරිච්ඡේදය වෙන් කර ගතිමි. කාන්තාවගේ වගකීම්භාරය ක්‍රමයෙන් පුළුල් වන මෙවන් යුගයක ඇය අධ්‍යාපනයක් ලැබීම, අධ්‍යාපනික වශයෙන්ද ආර්ථික හා සමාජීය වශයෙන්ද වැදගත්වන ආකාරය එහිදී පෙන්වා දුනිමි.

නිදහසින් පසු කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය විමර්ශනය කිරීමේදී, එයට පාදක වශයෙන් නිදහසට පෙර කාන්තාව ලබාගත් අධ්‍යාපනය වැදගත් වන නිසා, එම අවධියේ කාන්තා අධ්‍යාපනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් පරීක්ෂා කර බැලීම දෙවන පරිච්ඡේදයේ කෙළෙමි. මෙහි නිදහසට පෙර පැවති කාන්තා අධ්‍යාපනය ගැන සඳහන් කිරීමේදී යටත් විජිත සමයට පෙර අවධියත්, පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය අවධීන්වල කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමට මම අදහස් කෙළෙමි.

කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය විමසන විට එවැනි සංවර්ධනයක සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මුහුණපාන බාධක අතර, කාන්තාව අධ්‍යාපනය ලබා ගැනීම පිළිබඳව සමාජයේ පැවති හා සමාජයේ පවත්නා ආකල්ප ගැන සඳහන් කිරීම අතිශයින්ම වැදගත්වන හෙයින් තුන්වැනි පරිච්ඡේදය එම කාර්යය සඳහා වෙන්කර ගතිමි. මෙහිදී කාන්තා අධ්‍යාපන මට්ටම් හා සාක්ෂර බව පිළිබඳව කරුණු සැකෙවින් ඉදිරිපත් කිරීමට සිදුවූයේ ප්‍රස්තුතයෙන් බැහැරයාම වළක්වා ගැනීම සඳහායි.

කාන්තාව ලබා තිබූ අධ්‍යාපන මට්ටම් තුළින් කෙතෙක් දුරට ඔවුන් අධ්‍යාපනයට නැඹුරු වී සිටීදැයි විමසීමත්, සාක්ෂර බව තුළින් කාන්තා අධ්‍යාපන සහභාගීත්වයේ ප්‍රමාණාත්මක මට්ටම ගැනත් සඳහන් කිරීමට මෙහිදී අදහස් කෙළෙමි.

ඉන් අනතුරුව හතරවැනි පරිච්ඡේදයේදී නිදහසට පසු ශ්‍රී ලංකා කාන්තා අධ්‍යාපනයේ සංවර්ධනය ගැන පැහැදිලි කිරීමේදී කාන්තාව අධ්‍යාපනයට සහභාගිවීම හා කාන්තා අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම මගේ අභිප්‍රාය විය. නිදහසින් පසු කාන්තා අධ්‍යාපනය ක්‍රමයෙන් ව්‍යාප්තවූ ආකාරයත්, එයට බලපෑ සාධකත් පිළිබඳව විමසීමටද මෙහිදී අදහස් කෙළෙමි. නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වීම හා ඉංග්‍රීසි මාධ්‍යය වෙනුවට ස්වභාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනයක් ලබාගැනීමට අවස්ථාව ලබා දීම තුළින් කාන්තාවන්ට අධ්‍යාපනයට සහභාගිවීමේ අවස්ථාව පුළුල් වී ගිය ආකාරයත්, ගම්බද ප්‍රදේශවල ඇතිවූ පාසැල් ව්‍යාප්තිය තුළින් හා රජයේ අධ්‍යාපන ශුභ සාධක කටයුතු හේතුවෙන් කාන්තා අධ්‍යාපන සංවර්ධනයට ලැබුණු රුකුලත් මෙහිදී සඳහන් කෙළෙමි.

ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී කාන්තාවන් වශයෙන් තම හැකියාවින් [illegible] ඉටුකළහැකි කාර්යභාරයන්ද, ජාතියක් ගොඩනැංවීමේ භාරදූර කර්තව්‍යයේදී ( task ) කාන්තාව ආර්ථික සංවර්ධනයට උරදිය හැකි ආකාරයද, එයට අධ්‍යාපනයෙන් ලැබෙන පිටුවහලද පස්වන පරිච්ඡේදයේදී විස්තර කෙළෙමි. සංවර්ධනයෙහිලා කාන්තා සහභාගිත්වය ප්‍රශස්ථ ලෙසින් ඉටුවීමට විචල්‍ය රාශියක් බලපෑ හැකිය. නමුත් මෙහිදී ප්‍රස්තුතයට උචිතයැයි සැලකෑ හෙයින් අධ්‍යාපනය සංවර්ධනය සඳහා උපකාරිවන ආකාරය පමණක් සලකා බැලීම මගේ අදහස විය. පළමුවෙන්ම පුද්ගල සංවර්ධනයත්, ඒ මත ප්‍රාදේශීය හා ජාතික සංවර්ධනයත් එකිනෙක දැඩි ලෙස බැඳී තිබෙන බැවින් පුද්ගල අධ්‍යාපන අවශ්‍යතා සන්තර්පනය කිරීම තුළින්, සංවර්ධනයට මඟ පෑදෙයි. සංවර්ධනය සමස්ථ ජනතාවගේම

සංවර්ධනයක් ලෙස සැලකෙන බැවින්, කාන්තාව සංවර්ධනයේ අනිවාර්ය කොටස් කරුවෙකු බව පැහැදිළිය. මේ නිසා කාන්තාව අධ්‍යාපනය ලබාගැනීම තුළින් සංවර්ධනයට සහභාගි කර ගැනීමට හැකිවන ආකාරය මෙම පරිච්ඡේදයේ සැකෙවින් සඳහන් කෙළෙමි.

හයවන පරිච්ඡේදය එනම් අවසාන පරිච්ඡේදයේදී මා අදහස් කෙළේ කාන්තාවන් අධ්‍යාපනය ලබා ගැනීමේදී මුහුණ පාන පොදු ගැටළු, එනම් අධ්‍යාපන සහභාගිත්වයේදී පාසැලින් පිට හා පාසැල තුළදී මතුවන ගැටළු, ආර්ථික අපහසුකම් නිසා ඇතිවන ගැටළු, මානසික සාධක හා සමාජීය සාධක නිසා ඇතිවන ගැටළු ඉදිරිපත් කිරීමත්, ඒවා විසඳා ගැනීමට යොදාගත හැකි විසඳුම් හා සහනදායි ක්‍රියා මාර්ගයන්ද පිළිබඳව පැවසීමටය.